අධ්‍යාපන අමාත්‍යාංශය

ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව

සිංහල භාෂා ඒකකය

සිංහල භාෂාව හා සාහිත්‍ය තරඟාවලිය 2023

කලාප මට්ටම

---

01 අපේක්ෂකයාගේ නම ඃ-

(මුලකුරු සමඟ නම පැහැදිලිව ලියන්න)

.....................................................................................................................................

02 විදුහලේ නම හා ලිපිනය ඃ-...........................................................................................

03 පාසල් වර්ගය ඃ-...........................................................................................

04 කලාපය ඃ-...........................................................................................

05 කොට්ඨාසය ඃ-...........................................................................................

**භාෂා භාවිතය හා අවබෝධය**

**6 ශ්‍රේණිය** **කාලය පැය 2**

**ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න**

**1 කොටස**

(01) නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පදය තෝරා යටින් ඉරක් අඳින්න

1) සසුන, පිලිරුව , නිදර්ෂක

2) ගැහැනිය , ප්‍රශ්නය , ලේකනය

3) උලෙල , බළලා , වලල්ල

4) පියානෝ , මුද්‍රණය , ශ්‍රේණිය

(02) නිවැරදි ආඛ්‍යාතය යොදා හිස්තැන් පුරවන්න

1) ගස්හු සුළඟට .................... (වැනෙයි , වැනෙති)

2) ළමයි උදෑසනම පාසලට ..................... (පැමිණෙයි , පැමිණෙති)

3) තෝ දිනපතා පන්සලට ..................... (යන්නෙහි , යන්නේ ය)

4) ඔවුහු කුඹුරු රැක ගැනීමට දුක් ..................... (වින්දේය , වින්දෝය)

5) අපි අමුණ ..................... (බඳිමු , බඳිමි)

(03) පහත දැක්වෙන ඉරි ඇඳි අකුරේ ඇති පිල්ලමෙහි නම තිත් ඉරි මත ලියන්න

1) කැටය - .......................................................................................................

2) මාලය - .......................................................................................................

3) ක්‍රමය - .......................................................................................................

4) රුවනි - .......................................................................................................

5) මෘගයා - .......................................................................................................

(04) පහත දැක්වෙන වචන නිවැරදිව ගළපා වාක්‍ය නිවැරදිව ලියන්න

1) වැඩපල/ගොවියා/කළේය/ඉතා/සිය/මහන්සියෙන්

.......................................................................................................................................

2) පොත/නඟා/ළමයා/කියවයි/පාඩම්/ශබ්ද

.......................................................................................................................................

3) ගවයින්/යති/සාන්නට/සී/දක්කාගෙන

.......................................................................................................................................

4) දොරටුව/වෙළෙන්දිය/අසල පලතුරු/පාසැල්/වික්කාය

.......................................................................................................................................

5) ඇත්තු/ඈතට/යති/වෙසෙන/වනයේ/සොයා/වතුර

.......................................................................................................................................

(05) පහත දැක්වෙන උක්ත පදවල අනුක්ත රූපය ඉදිරියෙන් ලියන්න

1) ඔවුහු - .....................

2) කුරුල්ලෝ - .....................

3) තොපි - .....................

4) මිනිසෙක් - .....................

5) අපි - .....................

(06) පහත දැක්වෙන පදවලට සමාන පද ලියන්න

1) එළිය - .....................

2) වතුර - .....................

3) සොම්නස - .....................

4) වනාන්තරය - .....................

5) සුන්දර - .....................

(07) පහත දැක්වෙන පදවලට සමාන පද ලියන්න

1) ආවරණ - ....................  2) අන්ත - ....................

3) අල්පේච්ඡ - ....................  4) ආචාර - ....................

5) අබියස - ....................

(08) පහත දැක්වෙන පදවලට ගැළපෙන විශේෂණ පද යොදන්න

1) .................... ළමයා

2) .................... සේවකයා

3) .................... අහස

4) .................... ගීතය

5) .................... සිංහයා

(09) පහත සඳහන් වාක්‍ය බහුවචනයට හරවන්න

1) ළමයා පොත්පත් පාඩම් කරයි

2) තාරකාව අහසේ එළිය පතුරවයි

3) ගුරුවරයා සාහිත්‍යය ඉගැන්නුවේය

4) වලාකුළ අහසේ පාවෙයි

5) කුරුල්ලා අහසේ පියාසර කරයි

(10) පහත සඳහන් කොටසට තනි පදය බැගින් ලියන්න

1) යමෙකුගේ ප්‍රකාශයකට ලැබෙන උත්තරය ඃ-

2) ජනයා වාසය කරන ප්‍රදේශය ඃ-

3) බුද්ධිමත්කමින් අඩු පුද්ගලයා ඃ-

4) ලෙඩරෝග බෝවෙමින් පැතිරයාම ඃ-

5) වනය නිසා සෙවණ වූ පෙදෙස ඃ-

**11 කොටස**

(1) රන් පිඟාන ලෙස වට කු රු
දිලිහි දිලිහි තිබෙන අපූ රු
හඳ හාමියෙ! හඳ හාමියෙ !
කිරිත් පැණිත් දියෝ ! දියෝ !
එම පිඟාන මැද හිඳි න්නෙ
හාවෙකි කිරි පැණි දකි න්නෙ
හඳ හාමියෝ! හඳ හාමියෝ!
කිරිත් පැණිත් දියෝ ! දියෝ!

අමාවකයි නුඹ නැති දා

අටවක නැමි පනාව දා

හඳ හාමියෝ! හඳ හාමියෝ!

කිරිත් පැණිත් දියෝ ! දියෝ!

පසළොස්වක පිඟාන දා

නුඹට මගේ දෝත ඉඳා

හඳ හාමියෝ! හඳ හාමියෝ!

කිරිත් පැණිත් දියෝ ! දියෝ!

(1) මෙම පැදි පෙළට සුදුසු මාතාකාවක් යොදන්න

(2) මෙම පැදි පෙළට අනුව හඳහාමිගෙන් ඉල්ලන්නේ මොනවාද?

(3) මෙහි සඳහන් අප්‍රාණවාචී නාම පද 2 ක් ලියන්න

(4) පැදි පෙළෙහි සඳහන් උපමාවක් ලියන්න

(5) පහත වචනවල පිල්ලම් නම් කරන්න

දිලිහි ඃ-

නුඹට ඃ-

(ලකුණු 20)

(02) පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

නූතන ගෙඋයනක , පොදු ගොඩනැගිලි සංකීර්ණයක , නගරයේ වටරවුමක මෙන්ම ජනයා රැස්වන සුවිසල් උද්‍යානයක රිදී පැහැයෙන් අහසට ජලය විහිදුවන ජලමල් දැකිය හැකි ය . මේ ජලමල් දර්ශනීය රටා මවමින් නන් පැහැයෙන් යුතු විදුලි ආලෝකයෙන් වර්ණවත් වන ආකාරය උත්සව සමයක රාත්‍රී කාලයේ වුවද දර්ශනය වේ. තාක්ෂණයෙන් පරිපූර්ණ නූතන කාල වකවානුවේ දී මෙබඳු විසිතුරු ජල මල් දැකීම අරුමයක් නොවේ.

පස්වෙනි සිවයස තරම් ඈත අතීතයේදී යන්ත්‍රානුසාරයෙන් නොව ස්වයංක්‍රීයව ක්‍රියාත්මක වෙමින් අහසට ජලය විහිදු ජලමල් නිර්මාණය වූ බවත්, එසේ නිර්මාණය වූ ජලමල් අද ද අතීතයේ මෙන් ම ක්‍රියාත්මක වන බව ඇසීම මෙන් ම දැකීමත් විස්මිත කරුණකි . මෙම ජලමල් ක්‍රියාකාරී වන්නේ අසිරිමත් සීගිරි පර්වතය පාමුල පිහිටි ජල උද්‍යානයේ ය.

ශ්‍රී ලංකාවට පමණක් නොව මුළු ලෝකයටම අයිති ලෝක උරුමයක් ලෙස සැලකෙන සීගිරිය ආසියාවේ පිහිටා තිබෙන ප්‍රධාන පුරා විද්‍යාත්මක මධ්‍යස්ථානවලින් එකකි කඳු හෙල් හා වනපෙත් වලින්ද මහ වැව් වලින් ද ඉපැරණි ගම් නියම් ගම් වලින් ද වටවූ සීගිරිය අපේ ඉතිහාසයට එක් වන්නේ ක්‍රිස්තු වර්ෂ පස්වෙනි සියවස පමණ කාලයේ සිට ය. එනම් ක්‍රි.ව. 477 -495 කාලය තුළ සීගිරිය සිය රාජධානිය කරගත් පළමුවන කාශ්‍යප රාජ්‍ය සමයේ සිට ය එහෙත් මෙම පෙදෙසින් සොයා ගත් කෙටි බ්‍රාහ්මී ශිලා ලිපි සහ වෙනත් පුරාවිද්‍යාත්මක සාධකවලින් පැහැදිලි වන්නේ සීගිරිය ආදිම ආර්ය ජනාවාසයක් වූ බවයි.

1) ජලමල් දැකිය හැකි ස්ථාන මොනවා ද?

2) මෙහි දැක්වෙන ලෝක උරුමය කුමක් ද?

3) ක්‍රි.ව. 477-495 කාලය තුළ කාශ්‍යප රාජධානිය කර ගත්තේ කුමන ප්‍රදේශයක ද?

4) මෙහි ඡේදයට අනුව පුරාවිද්‍යාත්මක සාධක වලින් කුමක් පැහැදිලි වේ ද?

5) පහත වචනවල අර්ථ ලියන්න

1 නියම්ගම්

2 ඉපැරණි